ගම්පහ දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා කාරක සභා 26 - 2024

---

1. විගණන මතය

1.1 ගම්පහ දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා කාරක සභා 26 ක 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශන සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යයසාධන ප්‍රකාශන, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශන සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශන සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන්වලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 2000 අංක 46 දරන ගොවිජන සංවර්ධන පනතේ 58(1) වගන්තියේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

1.2 2024 වර්ෂයේ ගම්පහ දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා කාරක සභා 26 කට අදාලව විගණන වාර්තා නිකුත් කර තිබුණු අතර, එම වාර්තාවලින් කාරක සභා 01 ක මතය ව්‍යාවනය කර තිබූ අතර, කාරක සභා 25 ක් සඳහා තත්ත්වාගණනය කළ මතයක් ප්‍රකාශ කර තිබුණි. ඒ සඳහා හේතු වී තිබූ ප්‍රමාණාත්මක දෝෂයන් පහත දැක්වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන

1.3.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත ඇතුලත්ව ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අනුකූල නොවීම.

	විගණන නිරීක්ෂණ	කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 01 හි 19 ඡේදය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සහ ඉදිරිපත් කිරීම සම්බන්ධ වගකීම එහි කළමනාකරණය සතු වන බව දක්වා තිබුණද ගොවිජන සේවා කාරක සභා 7 ක මූල්‍ය ප්‍රකාශන තුළ එම වගකීම ප්‍රමිතියේ පරිදි දක්වා නොතිබුණි.	පිළිගනිමි.	ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 01 ට අනුකූලව මූල්‍ය ප්‍රකාශන සකස් කර ඉදිරිපත් කළ යුතුය.
(ආ)	ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 1 හි 21 ඡේදය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන කට්ටලයට ස්කන්ධය වෙනස්වීම් ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය ඇතුලත් විය යුතු වුව ද යක්කල හා ගලහිටියාව කාරක සභා විසින් ස්කන්ධය වෙනස්වීම් ප්‍රකාශයද බඩල්ගම ගොවිජන සේවා කාරක සභාව විසින් මුදල් ප්‍රවාහ ප්‍රකාශනයද මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර නොතිබුණි.	පිළිගනිමි.	ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 01 ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන සංරචකයන් ඉදිරිපත් කළ යුතුය.
(ඇ)	ප්‍රමිත අංක 01 හි 53 වන වගන්තිය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන භාවිත කරන පාර්ශවයන්ට පහසුවෙන් තේරුම් ගැනීමට හැකිවන පරිදි පසුගිය වර්ෂයේ සංසන්දනාත්මක තොරතුරු මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කල යුතු වුවද	පිළිතුරු ලබා දී නොතිබුණි.	ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 01 ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන සකස් කර ඉදිරිපත් කළ යුතුය.

	ගලහිටියාව ගොවිජන සේවා කාරක සභාව විසින් මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, මූල්‍ය තත්ව ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය ඉදිරිපත් කිරීමේ දී එලෙස කටයුතු කර නොතිබුණි.		
(ඈ)	ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 7 හි 65 වන ඡේදය ප්‍රකාරව වත්කමක වටිනාකම සහ ප්‍රයෝජනවත් ජීව කාලය අවම වශයෙන් සෑම වාර්ෂික වාර්තා කරන කාල පරිච්ඡේදයක් අවසන් වන දිනයේ දී සමාලෝචනය කල යුතු වුවද කාරක සභා 5 කට අදාළව වත්කම් අයිතම 19 ක් සම්බන්ධයෙන් එලෙස කටයුතු කර නොතිබුණි.	පිළිගනිමි.	ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 07 ප්‍රකාරව වත්කම් සමාලෝචනය කළ යුතුය.
(ඉ)	ගොවිජන බැංකුව ගොවිජන සේවා කාරක සභාවේ ඒකකයක් බැවින් ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කල යුතු වුවත් කාරක සභා 26 ම එපරිදි ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර නොතිබුණි.	ගොවිජන සේවා දෙපාර්තමේන්තුවෙන් සපයා ඇති ආකෘතිය ප්‍රකාරව ගිණුම් වාර්තාව සකස් කර ඇත.	ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමට කටයුතු කළ යුතුය.
(ඊ)	ගොවිජන සේවා කාරක සභා 03 ක මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ දී භාවිතා කළ ගිණුම්කරණ ප්‍රතිපත්ති සියල්ල අදාළ මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.	පිළිගනිමි.	ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත ප්‍රකාරව ගිණුම්කරණ ප්‍රතිපත්ති හෙළිදරව් කළ යුතුය.

1.3.2 ගිණුම්කරණ අඩුපාඩු

	විගණන නිරීක්ෂණය	**කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම**	**නිර්දේශය**
(අ)	ගොවිජන සේවා කාරක සභා 03ක සමාලෝචිත වර්ෂයේ මුදල් ප්‍රවාහ ප්‍රකාශ පිළියෙල කිරීමේදී මෙහෙයුම් ක්‍රියාකාරකම් යටතේ දැක්විය යුතු රු.996,052 ක් වූ මෙහෙයුම් ගණුදෙනු ආයෝජන ක්‍රියාකාරකම් ලෙසත්, රු.3,679,834 ක් වූ මෙහෙයුම් ගණුදෙනු මූල්‍ය ක්‍රියාකාරකම් ලෙසත් දක්වා තිබුණි.	පිළිගනිමි.	ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 02 ප්‍රකාරව මුදල් ප්‍රවාහ ප්‍රකාශ සකස් කර ඉදිරිපත් කළ යුතුය.

(ආ)	වසර කිහිපයක් තුල රජය විසින් පොහොර මිල අඩු කිරීම හා නොමිලේ ලබාදීම නිසා කාරක සභා 3 කට අදාළව දැරීමට සිදුවී තිබූ එකතුව රු.942,920 ක අලාභය පොහොර සමාගම්වලින් අයවිය යුතු මුදලක් ලෙස දක්වා තිබීමෙන් එම ප්‍රමාණයෙන් මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ ව්‍යාජ වත්කම් දක්වා තිබුණි.	අලාභයන් අයකර ගැනීමට ලිපි ඉදිරිපත් කල ද නොලැබුණ බැවින් විධිමත් අවසරයක් ලබාගෙන ගිණුම්වලින් ඉවත් කිරීමට කටයුතු කරමි.	අලාභයන් නිවැරදිව ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය.
(ඇ)	කාරක සභා 2ක ස්ථාවර තැන්පතු පොළී ආදායම රු.450,233 ක් වැඩියෙන් ගණනය කර තිබුණි.	පිළිතුරු ලබා දී නොතිබුණි.	ස්ථාවර තැන්පතු පොළිය නිවැරදි අනුපාතයට හා කාලයට අනුව ගණනය කර මූල්‍ය ප්‍රකාශනවල නිවැරදි අගය දැක්විය යුතුය.
(ඇ)	මාබොදල සහ මරදගහමුල ගොවිජන සේවා කාරක සභා 2 හි රු.218,595 ක් වූ හිඟ විගණන ගාස්තු සඳහා සමාලෝචිත වර්ෂයේ ප්‍රතිපාදන වෙන් කර නොතිබුණි.	ප්‍රතිපාදන වෙන් කර වාරික වශයෙන් ගෙවීම් කෙරේ.	ගෙවිය යුතු විගණන ගාස්තු සඳහා ප්‍රතිපාදන වෙන් කිරීම් කළ යුතුය.
(ඉ)	කාරක සභා 04 කට අදාළව ගිණුම් විෂයන් 04ක පොදු ලෙජරය අනුව වියදම් වටිනාකම ශේෂ පිරික්සුමට ගෙන ඒමේදී රු.364,822 ක් වැඩියෙන් දක්වා තිබුණි.	නිවැරදි කිරීමට කටයුතු කරමි.	වර්ෂයේ වියදම් නිවැරදිව ගිණුම්ගත කළ යුතු අතර, ගිණුම්කරණ ක්‍රියාවලිය විධිමත් කිරීමට පියවර ගත යුතුය.
(ඊ)	බෙම්මුල්ල ගොවිජන සේවා කාරක සභාවේ ණයහිමි උපලේඛනය ප්‍රකාරව රාජ්‍ය පොහොර සමාගමට 2024 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු මුදල රු.580,673 ක් ලෙස දක්වා තිබුණද මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ එදිනට ගෙවිය යුතු ශේෂය රු.615,828ක් ලෙස රු.35,155ක් වැඩියෙන් දක්වා තිබුණි.	නිවැරදි කිරීමට කටයුතු කරමි.	ශේෂයන් සසඳා නිවැරදි ශේෂය මූල්‍ය ප්‍රකාශනවල සඳහන් කල යුතුය.
(උ)	පස්යාල ගොවිජන සේවා කාරක සභාවේ ස්කන්ධය වෙනස්වීම් ප්‍රකාශය අනුව 2024 දෙසැම්බර් 31 දිනට සමුච්චිත අරමුදල රු.2,943,849 ක් වුවද මූල්‍ය තත්ත්ව ප්‍රකාශය අනුව එය රු.2,660,687 ක් වූයෙන් රු.283,162 ක වෙනසක් පැවතුණි.	ඉදිරි වර්ෂයේ දී නිවැරදි කරමි.	ශේෂයන් සසඳා නිවැරදි ශේෂ මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කළ යුතුය.
(ඌ)	දොම්පෙ ගොවිජන සේවා කාරක සභාවට අයත් ට්‍රැක්ටර් රථයක් වසර 02 ක් සඳහා වසරකට රු.20,000 බැගින් ගොවි සංවිධානයකට බදු දීමෙන් ලැබිය යුතු බදු ආදායම ගිණුම්ගත කර නොතිබුණි.	අරමුදලට ගැලපීමට උපදෙස් දී ඇත.	කාලච්ඡේදයට අදාළ ආදායම්/ වියදම් නිවැරදිව ගිණුම් ගත කළ යුතුය.

(එ)	දොම්පෙ ගොවිජන සේවා කාරක සභාවේ 2024 දෙසැම්බර් 31 දිනට බැංකු සනාථන අනුව හා මූල්‍ය ප්‍රකාශන අනුව ස්ථාවර තැන්පතු වටිනාකමේ රු.1,992,425ක නොසැසඳු වෙනසක් පැවතුණි.	පිළිතුරු ලබා දී නොතිබුණි.	ශේෂයන් සසඳා නිවැරදි ශේෂය මූල්‍ය ප්‍රකාශනවලට ඇතුලත් කළ යුතුය.
(ඒ)	දොම්පෙ ගොවිජන සේවා කාරක සභාවේ ස්ථාවර තැන්පතු පොළිය උපචිත පදනමට ගණනය නොකිරීමෙන් රු.640,056 ක පොළිය ගිණුම්වලින් මග හැරී තිබුණි.	පිළිතුරු ලබා දී නොතිබුණි.	ගිණුම්කරණ ප්‍රමිත ප්‍රකාරව වර්ෂයේ ආදායම් ගණනය කිරීමට කටයුතු කළ යුතු අතර, නිවැරදි අගයන් මූල්‍ය ප්‍රකාශනවල දැක්විය යුතුය.
(ඓ)	පල්ලෙවෙල ගොවිජන සේවා කාරක සභාවේ සමාලෝචිත වර්ෂයට අදාල අත්ට්‍රැක්ටර් ආදායම රු.18,000 ක් මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ ලැබිය යුතු ආදායම් ලෙස දක්වා නොතිබීමෙන් අතිරික්තය හා ජංගම වත්කම් රු.18,000 ක් අඩුවෙන් දක්වා තිබුණි.	නිවැරදි කිරීමට කටයුතු කරමි.	ගිණුම්කරණ ප්‍රමිත ප්‍රකාරව වර්ෂයේ ආදායම් ගණනය කිරීමට කටයුතු කළ යුතු අතර, නිවැරදි අගයන් මූල්‍ය ප්‍රකාශනවල දැක්විය යුතුය.
(ඔ)	ගලහිටියාව ගොවිජන සේවා කාරක සභාවේ රු.382,487ක තොග ඌණතාවයක් සම්බන්ධයෙන් හා රු.78,607 ක අඩු මිලට විකිණීම සම්බන්ධයෙන් ඇති වූ අලාභය ගිණුම් පොත්වල පවත්වාගෙන එන අතර එම ශේෂ නිරවුල් කර නොතිබුණි.	පිළිතුරු ලබා දී නොතිබුණි.	වගකිවයුතු අදාළ පාර්ශව වෙතින් අයකිරීම හෝ විධිමත් අනුමැතියක් ලබා ගෙන මූල්‍ය ප්‍රකාශනවලින් ගැලපීම් කිරීමට කටයුතු කළ යුතුය.
(ක)	ගලහිටියාව ගොවිජන සේවා කාරක සභාවේ 2023 දෙසැම්බර් 31 දිනට බැංකු ජංගම ගිණුමේ ශේෂය රු.1,227,595 ක් වූ අතර එය ශේෂ පිරික්සුමේ 2024 ජනවාරි 01 දිනට ආරම්භක ශේෂය ලෙස රු.1,187,475 ක් ගිණුම්ගත කිරීමෙන් රු.40,120ක වෙනසක් පැවතුණි.	පිළිතුරු ලබා දී නොතිබුණි.	නොසැසඳීමට අදාළ හේතු අනාවරණය කර ගැනීමත්, නිවැරදි ගිණුම් ශේෂයන් අනුව වාර්ෂික මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමත් කළ යුතුය.
(ඛ)	ගලහිටියාව ගොවිජන සේවා කාරක සභාවේ බැංකු ජංගම ගිණුමේ ශේෂය ලෙස මුදල් පොතේ රු.1,673,168 ක් ලෙස සටහන් කර තිබුණු අතර, මූල්‍ය ප්‍රකාශනවල එය රු.1,653,800 ක් ලෙස රු.19,368 ක් අඩුවෙන් දක්වා තිබුණි.	පිළිතුරු ලබා දී නොතිබුණි.	- එම -

1.3.3 නොසැසඳූ පාලන ගිණුම් හෝ වාර්තා

	විගණන නිරීක්ෂණය	කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ගොවිජන සේවා කාරක සභා 7ක ගිණුම් විෂයන් 47 කට අදාළව පොදු ලෙජරය අනුව ශේෂයන් හා ශේෂ පිරික්සුම අනුව ශේෂයන් අතර රු.5,359,149 ක වෙනසක් පැවතුණි.	ජර්නල් සටහන් තුළින් ගණුදෙනු සටහන් කිරීමේ දී ලෙජරයේ සටහන් වී නොතිබුණි.	ගිණුම්කරණ ක්‍රියාවලිය විධිමත් කිරීමත්, නිවැරදි ගිණුම් ශේෂයන් ශේෂ පිරික්සුමට ඇතුළත් කිරීමත් කළ යුතුය.
(ආ)	ගොවිජන සේවා කාරක සභා 4ක ගිණුම් විෂයන් 5 කට අදාළව තොග සත්‍යාපන වාර්තා අනුව ශේෂයන් හා මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂයන් අතර රු.3,761,437 ක වෙනසක් පැවතුණි.	එකඟ වෙමි.	ගිණුම් ශේෂ සසඳා නිවැරදි ශේෂයන් මූල්‍ය ප්‍රකාශනවලට ඇතුලත් කළ යුතුය.
(ඇ)	ගොවිජන සේවා කාරක සභා 3 ක ගිණුම් විෂයන් 4 කට අදාළව ස්ථාවර වත්කම් උපලේඛන අනුව ශේෂයන් හා මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂයන් අතර රු.748,108 ක වෙනසක් පැවතුණි.	නිවැරදි කිරීමට කටයුතු කරමි.	- එම -

1.3.4 අධිකාරී බලය නොලත් ගණුදෙනු

	අධිකාරී බලය නොලත් ගනුදෙනු පිළිබඳ විස්තරය	කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	රු.100,000 ට වඩා වැඩි ගෙවීම් සම්බන්ධයෙන් ගොවිජන සේවා සහකාර කොමසාරිස්ගේ අනුමැතිය ලබා ගත යුතු වුවද, සමාලෝචිත වර්ෂයේදී ගොවිජන සේවා කාරක සභා 2 ක අවස්ථා 8 කට අදාලව රු.4,506,210 ක් වූ ගෙවීම් කිරීමේදී එපරිදි අනුමැතිය ලබා ගෙන නොතිබුණි.	පිළිතුරු ලබා දී නොතිබුණි.	විධිමත් අනුමැතිය ලබා ගත යුතු අතර, එසේ නොකළ පාර්ශව වෙත පියවර ගත යුතුය.
(ආ)	ගලහිටියාව ගොවිජන සේවා කාරක සභාවේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ව ප්‍රකාශයේ ඇතුලත්ව නොතිබුණු රු.1,684,220 ක් වටිනා ගිණුම් ශේෂ 17 ක් අධිකාරී බලයකින් තොරව 2024 ජනවාරි 1 දිනට ශේෂ පිරික්සුමට ඇතුලත් කර තිබුණි.	පිළිතුරු ලබා දී නොතිබුණි.	විධිමත් අනුමැතිය මත ජර්නල් සටහන් මගින් ගිණුම්වල ගැලපීම් කළ යුතුය.
(ඇ)	කාරක සභා 4ක් විසින් 2024 වර්ෂයේ ගිණුම්ගත කරන ලද ජර්නල් සටහන් 227 ක් සඳහා, විධිමත් පරිදි අනුමැතිය ලබා ගෙන නොතිබුණි.	පිළිතුරු ලබා දී නොතිබුණි.	ජර්නල් සටහන් සඳහා විධිමත් අනුමැතිය ලබා ගත යුතු අතර, එසේ අනුමැතියකින් තොරව කටයුතු කළ පාර්ශවයන්ට පියවර ගත යුතුය.

1.3.5 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

	විගණන නිරීක්ෂණය	කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ගොවිජන සේවා කාරක සභා 3 ක එකතු වටිනාකම රු.2,387,513 ක් වූ ස්ථාවර තැන්පත් 4 කට අදාළව ස්ථාවර තැන්පත් ලේඛනය, කල් පිරීමේ නිවේදන වැනි ලිඛිත සාක්ෂි නොතිබීම හේතුවෙන් එම ගිණුම් ශේෂයන් විගණනයේ දී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.	පිළිගනිමි. ඉදිරියේ දී ලබා දීමට කටයුතු කෙරේ.	ලිඛිත සාක්ෂි ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය.
(ආ)	ගොවිජන සේවා කාරක සභා 5ක වසර ගණනාවක සිට පැවත එන රු.3,359,537ක් වූ ගිණුම් ශේෂයන් තහවුරු කිරීමට සාක්ෂි ඉදිරිපත් නොකළ බැවින් සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.	පිළිගනිමි. විධිමත් ලෙස කපා හැරීමට අනුමැතියට යවා ඇත.	ශේෂ සනාථ වන ලිඛිත සාක්ෂි ඉදිරිපත් කළ යුතුය.
(ඇ)	වැකේ ගොවිජන සේවා කාරක සභාවේ යූරියා පොහොර මිටි 60 ක් සඳහා ඉන්වොයිසියක ඡායා පිටපත් මත රු.555,000ක් ගෙවීම් කර තිබූ අතර, ඉන්වොයිසියේ මුල් පිටපත විගණනයට ඉදිරිපත් කළ යුතුය.	පිළිගනිමි. මුල් පිටපත ගෙන්වා වවුචරයට ඇමිණීමට කටයුතු කෙරේ.	ලේඛනවල මුල් පිටපත් මත ගෙවීම් කළ යුතු අතර, ඡායාපිටපත්වලට ගෙවීම් නොකළ යුතුය. මෙම ගෙවීමට අදාළ ඉන්වොයිසි මුල් පිටපත ඉදිරිපත් කළ යුතුය.
(ඇ)	පස්යාල ගොවිජන සේවා කාරක සභාවේ අවස්ථා 2 ක දී රු.46,087 ක ගෙවීම් සිදු කර ඇත්තේ ඉන්වොයිස් පත්‍ර, භාණ්ඩ ලැබීමේ සටහන් පත, ලද බවට තහවුරු පත් ලබා ගැනීමෙන් තොරව බැවින් විගණනයේදී ප්‍රමාණවත් පරිදි සන්නිරීක්ෂණය කළ නොහැකි විය.	අදාළ වවුචර් වලට සමාගමෙන් ලබා ගත් බිල්පත් අමුණා ඇත.	සියළු සනාථ කිරීම් සිදු කල පසු මුදල් ගෙවීම් කළ යුතු අතර, එසේ නොකළ පාර්ශව වෙත පියවර ගත යුතුය.
(ඉ)	බෙම්මුල්ල ගොවිජන සේවා කාරක සභාවේ 2018 ප්‍රතිපත්තිමය තීරණ මත පොහොර මිල අඩු වීම නිසා සිදු වූ රු.89,670 ක පාඩුව පොහොර ලේකම් කාර්යාලයෙන් ලැබිය යුතු ලෙස දක්වා තිබුණ ද සත්‍ය වශයෙන්ම ලැබිය යුතු ද යන්න තහවුරු වන ලිඛිත සාක්ෂි ඉදිරිපත් නොකෙරුණු බැවින් විගණනයේදී ප්‍රමාණවත් පරිදි සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.	පිළිගනිමි. මෙම මුදලට පොහොර මිල අඩුවීමෙන් වූ පාඩුව හා පොහොර නොමිලේ නිකුත් කිරීමෙන් වූ පාඩුවද ඇතුලත්ය.	ලිඛිත සාක්ෂි ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය.

1.4 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

	නීති, රීති, රෙගුලාසි යනාදියට යොමුව	අනුකූල නොවීම	කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය			
(i)	මුදල් රෙගුලාසි 133,134	ගොවිජන සේවා කාරක සභා 17 කට අදාලව එම කාරක සභාවල ගනුදෙනු අභ්‍යන්තර විගණනයට ලක්කර එම වාර්තාවල පිටපත් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.	පිළිගනිමි.	අභ්‍යන්තර විගණනයක් සිදු කර මුදල් රෙගුලාසිය ප්‍රකාරව ක්‍රියාකළ යුතුය.
(ii)	මුදල් රෙගුලාසි 139(7)	සහතික කරන ලද ගෙවීම් වවුචර් මත වවුචරයේ සඳහන් මුදල විධිමත් පරිදි ගෙවන බවට "ගෙවන ලදී" යනුවෙන් මුද්‍රා තබා කෙටි අත්සන යෙදිය යුතු වුවත් ගොවිජන සේවා කාරක සභා 3 ක වවුචර් 95 ක් සම්බන්ධයෙන් එසේ කටයුතු කර නොතිබුණි.	පිළිතුරු ලබා දී නොතිබුණි.	මුදල් රෙගුලාසිය අනුව කටයුතු කල යුතු ය.
(iii)	මුදල් රෙගුලාසි 753(2)	භාණ්ඩ ලැබුණු විට භාර ගන්නා නිලධාරියා විසින් 219 වැනි පොදු ආකෘති පත්‍රයේ ලැබීම් ඇණවුමක් පිළියෙල කළ යුතු වුව ද ගොවිජන සේවා කාරක සභා 3ක් සම්බන්ධයෙන් එසේ කටයුතු කර නොතිබුණි.	පිළිතුරු ලබා දී නොතිබුණි.	මුදල් රෙගුලාසි අනුව කටයුතු කිරීමට පියවර ගත යුතුය.
(ii)	මුදල් රෙගුලාසි 891(1)	ගොවිජන සේවා කාරක සභා 6ක ඇප තැබිය යුතු නිලධාරීන්ගේ තොරතුරු ඇතුලත් ඇප ලේඛනයක් පිළියෙල කර නොතිබුණි .	පිළිතුරු ලබා දී නොතිබුණි.	මුදල් රෙගුලාසි අනුව ඇප ලේඛනයක් පවත්වාගෙන යාමට කටයුතු කළ යුතු ය.
(ආ)	ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්ගේ චක්‍රලේඛ			

(i)	ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්ගේ 2020 ජූනි 25 දිනැති අංක 8/2020 දරන චක්‍රලේඛය හා මුදල් රෙගුලාසි 880	ගොවිජන සේවා කාරක සභා 25 ක ගොවිජන සංවර්ධන නිලධාරී සහ මධ්‍යස්ථාන ලිපිකරු නිලධාරින්ගෙන් පිළිවෙලින් රු.15,000 සහ රු.5000 බැගින් ඇප තැන්පතු ලබාගෙන නොතිබුණි.	ඇප තැබීම සඳහා සහකාර කොමසාරිස් - ගම්පහ වෙත ලිඛිතව එකඟතාවය යොමුකර ඇත.	චක්‍රලේඛය ප්‍රකාරව ඇප තැන්පතු ලබා ගැනීමට කටයුතු කළ යුතුය.
(ii)	2016 පෙබරවාරි 09 දිනැති අංක 03/2016 දරන චක්‍රලේඛය	බල ප්‍රදේශය තුල ලියාපදිංචි ගොවි සංවිධානවල ක්‍රියාකාරීත්වය පිළිබඳව අවම වශයෙන් මාස 4 කට වරක් වත්, කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාර නිළධාරීන් විසින් ද, අවම වශයෙන් මාසයකට එක් ගොවි සංවිධානයක්වත් ගොවිජන සංවර්ධන නිලධාරීන් විසින් ද ඉදිරිපත් කර ඇති පරීක්ෂණ ආකෘතිය පදනම් කරගෙන පරීක්ෂණ පැවැත්විය යුතු වුවත්, කාරක සභා 25 කට අයත් ගොවි සංවිධාන 877 කින් ගොවි සංවිධාන 42 ක් පිළිබඳව පමණක් පරීක්ෂණ පවත්වා තිබුණු අතර ගොවි සංවිධාන 835 ක් පිළිබඳව කිසිදු පරීක්ෂණයක් පවත්වා නොතිබුණි.	පිළිගනිමි. 2024 ජනවාරි මස සිට ආකෘති මඟින් පරීක්ෂණ පැවැත්වීමට කටයුතු කරමි.	චක්‍රලේඛය ප්‍රකාරව පරීක්ෂණ පැවැත්විය යුතු අතර, එසේ කටයුතු නොකළ නිළධාරීන්ට පියවර ගත යුතුය.
(iii)	1981 ඔක්තොබර් 16 දිනැති අංක 107 දරන චක්‍රලේඛය	ගොවිජන සේවා කාරක සභා 4ක වර්ෂය අවසානයේ සියළු ණය හිමියන්ගේ ශේෂ සනාථ කිරීම් ලබා ගෙන නොතිබුණි.	පිළිතුරු ලබා දී නොතිබුණි.	චක්‍රලේඛ ප්‍රකාරව ණය ශේෂ සනාථන ලබා ගැනීමට කටයුතු කළ යුතුය.

(iv)	1987 පෙබරවාරි 18 දිනැති අංක 55 දරන චක්‍රලේඛය	ගොවිජන සේවා කාරක සභා 6ක වසර ගණනාවක සිට පැවතෙන අයකර ගත යුතු ණය ශේෂ අය කර ගැනීමට හෝ අයකර ගත නොහැකි නම් විධිමත් පරිදි කපා හැරීමට කටයුතු කර නොතිබුණි.	පිළිතුරු ලබා දී නොතිබුණි.	ණය ශේෂ කාලීනව අය නොකළ නිලධාරීන්ට පියවර ගැනීමත්, චක්‍රලේඛ ප්‍රකාරව අය කර ගත යුතු ණය ශේෂය අය කර ගැනීමට කටයුතු කිරීමත් කළ යුතුය.

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවලට අනුව 2024 වර්ෂයේ ගොවිජන සේවා කාරක සභා 25 ක එකතුව රු.15,025,628 ක අතිරික්තයක් හා එක් කාරක සභාවක රු.203,820 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූපිව ඉකුත් වර්ෂයේ අතිරික්තය හා ඌනතාවය පිළිවෙළින් රු.13,541,062 ක් හා රු.2,826,714 ක් විය. සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵල අනුව ගොවිජන බැංකු 26 හි එකතුව රු.7,273,273 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපිව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.7,100,272 ක් විය.

2.2 මූල්‍ය ප්‍රතිඵල විශ්ලේෂණය

(අ) කාරක සභා 11 ක සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලවල එකතු වටිනාකම රු.7,475,268 ක අතිරික්තයක් වූ අතර, ඊට අනුරූපීව එම කාරක සභා 11 හි ඉකුත් වර්ෂයේ අතිරික්තවල එකතු වටිනාකම රු.4,954,011 ක් විය. ඒ අනුව එම කාරක සභා 11 හි මූල්‍ය ප්‍රතිඵලයන්හි රු.2,521,260 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයන්ට විකුණුම් ආදායම, අක්කර බදු ආදායම හා කාමර කුලී ආදායම ඉහළ යාම හේතුවී තිබුණි.

(ආ) කාරක සභා 05 ක සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලයෙහි එකතු වටිනාකම රු.4,402,925 ක අතිරික්තයක් වුවත්, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ එම කාරක සභා 05 හි ඌනතාවල එකතු වටිනාකම රු.2,826,714 ක් විය. ඒ අනුව එම කාරක සභා 05 හි මූල්‍ය ප්‍රතිඵලයන්හි රු.7,229,639 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට සේවා සැපයුම්, කාමර කුලී හා අක්කර බදු ආදායම් ඉහළ යාම සහ පෙර වර්ෂයේ පැවති ප්‍රාග්ධන වියදම් සමාලෝචිත වර්ෂයේ නොමැති වීම හේතුවී තිබුණි.

(ඇ) කාරක සභා 09 ක සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලයෙහි එකතු වටිනාකම රු.3,147,435 ක අතිරික්තයක් වුවත්, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තයෙහි එකතු වටිනාකම රු.6,453,565 ක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.3,306,130 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට කාරක සභාවක නඩත්තු වියදම වැඩි වීම, සේවා සැපයුම් ආදායම් අඩු වීම හා වියදම් ඉහළ යාම හේතු වී තිබුණි.

(ඈ) කාරක සභා 01 ක සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.203,820 ක ඌනතාවයක් වුවත් , ඊට ප්‍රතිරූපීව එම කාරක සභාවෙහි ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.2,083,453ක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵලයන්හි රු.2,287,273 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට පොහොර විකුණුම් ආදායම හා ස්ථාවර තැන්පත් පොලී ආදායමේ අඩුවීම හේතුවී තිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

	විගණන නිරීක්ෂණය	කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	කාරක සභා 26 කට අයත් මුළු කුඹුරු ඉඩම් අක්කර 45,087කින් වී වගා කල හැකි කුඹුරු ඉඩම් ප්‍රමාණය අක්කර 33,807 ක් විය. 2024/25 මහ කන්නයේ වී වගා කල ඉඩම් ප්‍රමාණය අක්කර 24,540 ක් විය. ඒ අනුව මහ කන්නයේ වගා නොකළ කුඹුරු ප්‍රමාණය අක්කර 9,267 ක් වී තිබුණි.	පිළිගනිමි. ඉදිරියේදී පුරන් කුඹුරු ප්‍රමාණය අවම කිරිමට උත්සාහ දරන බව දන්වා සිටිමි.	පුරන් කුඹුරු වගා කිරීම කෙරෙහි විධිමත් වැඩපිළිවෙලක් යෙදිය යුතුය.
(ආ)	ගොවිජන සේවා කාරක සභා 12 කට අයත් ගොවි සංවිධාන 381 කින් ගොවි සංවිධාන 29 ක් අක්‍රියව පැවති අතර ගොවිජන සේවා කාරක සභා 14 කට අයත් ලියාපදිංචි කාන්තා ගොවි සංවිධාන 679 කින් 188 ක් අක්‍රියව පැවතුණි.	පිළිගනිමි.	විධිමත් වැඩපිළිවෙලක් යොදා අක්‍රීය ගොවි සංවිධාන සක්‍රීය කිරීමට අවශ්‍ය පියවර ගත යුතුය.
(ඇ)	සමාලෝචිත වර්ෂය අවසන් වන විට ගොවිජන සේවා කාරක සභා 5 ක් පිහිටා ඇති අක්කර 3 රූඩ් 2 පර්චස් 83 කට ආසන්න භූමිය අදාළ ආයතන වෙතින් කාරක සභා වෙත පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.	එකඟ වෙමි. පවරා ගැනීමට අවශ්‍ය කටයුතු කෙරේ.	ඉඩම් පවරා ගැනීමේ කටයුතු කඩිනම් කල යුතුය.
(ඈ)	අක්කර බදු උප පත්‍රිකා නව පොතක් නිකුත් කිරීමේදී පැරණි පොත බාර ගෙන නව පොත නිකුත් කළ යුතු වුවත් ගොවිජන සේවා කාරක සභා 3ක් විසින් එසේ කටයුතු කර නොතිබුණි.	භාර නොදුන් පොත් භාර ගැනීමටත් ඉදිරියේදී පැරණි පොත භාර ගෙන නව පොත නිකුත් කිරීමටත් කටයුතු කෙරේ.	පැරණි උප පත්‍රිකා පොත බාර ගැනීමෙන් පසුව නව උප පත්‍රිකා පොත නිකුත් කළ යුතු අතර, එසේ නොකළ නිලධාරීන්ට පියවර ගත යුතුය.
(ඉ)	ගොවිජන සේවා කාරක සභා 12 ක බැංකු ජංගම ගිණුම් 13 කට අදාළව මාසික ශේෂය රු.500,000 සිට රු.820,501 ක පරාසයක පැවතිය ද විධිමත් අනුමැතියක් ගෙන කෙටි කාලීනව ආයෝජනය කිරීමට පියවර ගෙන නොතිබුණි.	එකඟ වෙමි. ඉදිරියේ දී කෙටි කාලීනව ආයෝජනය කිරීමට පියවර ගැනේ.	ජංගම ගිණුමේ අතිරික්තව පවතින මුදල් විධිමත් අනුමැතිය මත කෙටි කාලීනව ආයෝජනය කිරීමට පියවර ගත යුතුය.
(ඊ)	ගොවිජන කාරක සභා 4 ක ආරක්ෂිත වැටවල් හා පිවිසුම් ගේට්ටු කැඩී තිබුණ අතර ඒවා අලුත්වැඩියා කිරීමට අවශ්‍ය පියවරවල් නොගැනීම හේතුවෙන් කාරක සභා වල ආරක්ෂාව තහවුරු වී නොතිබූ අතර ගෙවතු ආදායමද අහිමි වී තිබුණි.	පිළිතුරු ලබා දී නැත.	අවශ්‍ය අළුත්වැඩියා කටයුතු සිදු කර කාරක සභාවේ ආරක්ෂාව තහවුරු කළ යුතුය.

(උ)	පමුණුගම ගොවිජන සේවා කාරක සභාවේ අලෙවි කුටිය ප්‍රයෝජනයට ගැනීමකින් තොරව නිශ්කාර්යව පැවතුණි.	අළුත්වැඩියා කර බාහිර අලෙවිසැල ලෙස පවත්වාගෙන යාමට ඉදිරියේදී කටයුතු කෙරේ.	විධිමත් වැඩපිළිවෙලක් යොදා කාරක සභාවේ සම්පත් නිෂ්කාර්යව නොතබා භාවිතයට ගත යුතුය.
(ඌ)	2024 වර්ෂය තුළ "තිරසර ගෙවත්ත" ගෙවතු වගා වැඩසටහන යටතේ ගොවිජන සේවා කාරක සභා 6ක් තුළ ගෙවතු 1210ක් වගා කර ඇතත් 2024 දෙසැම්බර් 31 දිනට ගෙවතු 298 ක් පමණක් ක්‍රියාකාරී තත්වයේ පැවති අතර ගෙවතු 921ක් අක්‍රීය වී තිබුණි.	අධික වර්ෂාව නිසා වගාවන් හානි වී ඇත.	නිලධාරීන්ගේ අධීක්ෂණය හා පසු විපරම් දැඩි කරවා ගෙවතු වගාවන් අඛණ්ඩව පවත්වාගෙන යාමට කටයුතු කළ යුතුය.
(එ)	මාබොඩල ගොවිජන සේවා කාරක සභාවේ 2008 හා 2009 වර්ෂවලට අදාලව විකුණා මුදල් ගෙවීමේ පදනම මත ලබාදුන් ද්‍රව්‍ය වෙනුවෙන් කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාර නිලධාරීන් දෙදෙනෙකුගෙන් අයකර ගත යුතු රු.57,360 ක් එම නිලධාරින්ගේ මියයාම හේතුවෙන් අයකරගත නොහැකි තත්ත්වයක පැවතුණි.	ශේෂ නිරවුල් කර ගැනීම සඳහා ගම්පහ දිස්ත්‍රික් ගොවිජන සංවර්ධන සහකාර කොමසාරිස් වෙත යවා ඇත.	විධිමත් පරිදි කටයුතු කර අයවිය ණය ශේෂ නිරවුල් කර ගැනීමට කටයුතු කළ යුතුය.
(ඒ)	බියගම ගොවිජන සේවා කාරක සභාවේ විකුණා මුදල් ගෙවීමේ පදනම මත ලබාදුන් වෙළඳ ද්‍රව්‍ය වෙනුවෙන් ලැබිය යුතු රු.23,456 ක් වූ පොළී මුදලක් 2019 වර්ෂයේ සිට පැවත එන අතර එම මුදල ඊට වගකිව යුතු කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාර නිලධාරීන් දෙදෙනාගෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.	පිළිගනිමි.	මුදල් ආපසු අය කර ගැනීමට සුදුසු පියවර ගත යුතුය.
(ඔ)	පස්යාල ගොවිජන සේවා කාරක සභාවේ 1989 සිට චක්‍රීය අරමුදලට ගෙවිය යුතු රු.70,000 ක් ගෙවීමට හෝ නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.	ගොවිජන සංවර්ධන දිස්ත්‍රික් කාර්යාලයෙන් උපදෙස් ඉල්ලා ඇත.	ගෙවිය යුතු ශේෂ නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය.
(ඕ)	පස්යාල ගොවිජන සේවා මධ්‍යස්ථාන ගොඩනැගිල්ලට පරිභාහිරව පැවති අලෙවි කුටිය කාන්තා ගොවි සංවිධානයක් වෙත මාසිකව රු.2,000 ක කුළී පදනම මත ලබා දී තිබුණු අතර ඒ සඳහා වලංගු කුළී ගිවිසුමක් නොතිබුණි.	වලංගු කුළී ගිවිසුමක් සකස් කිරීමට කටයුතු කරමි.	වත්කම් විධිමත් පරිදි ලිඛිත ගිවිසුමක් මත ලබා දීමට කටයුතු කළ යුතු අතර, කඩිනමින් සමිතිය සමඟ ගිවිසුමකට එළඹිය යුතුය.

(ක)	වල්පිට ගොවිජන සේවා කාරක සභාවේ වසර 03 ත් 06 ත් අතර කාලපරාසයක සිට පැවත එන රු.309,879 ක වටිනාකමින් යුතු ලැබිය යුතු ශේෂ අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.	අයකර ගැනීමට කටයුතු කරමි.	ලැබිය යුතු ශේෂ අය කර ගැනීමට කටයුතු කළ යුතුය.
(ග)	ගලහිටියාව ගොවිජන සේවා කාරක සභාවේ පසුගිය වර්ෂයේ ගිණුම් ප්‍රකාශනවල ද දක්වා තිබූ රු.132,458ක් වූ කපාහැරීමට නිර්දේශිත තොග සමාලෝචිත වර්ෂය අවසානයේ දී ද කපාහැර නොතිබුණි.	පිළිතුරු ලබා දී නොතිබුණි.	නිර්දේශිත තොග විධිමත් පරිදි පොත්වලින් කපා හැරීමට කටයුතු කළ යුතුය.
(ච)	බියගම ගොවිජන සේවා කාරක සභාවේ 2019 හා 2020 වර්ෂවල සිදු වූ තොග ඌණතාවයක් සම්බන්ධයෙන් රු.477,915 ක වටිනාකමක් එවකට තොග භාර නිලධාරියාගෙන් 2020 ජූනි 26 ට පෙර අයකර ගත යුතු වුවද, වසර 05 ක කාලයක් ගත වී ඇතත් එම මුදල අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.	පිළිතුරු ලබා දී නොතිබුණි.	නිර්දේශීත මුදල අයකිරීමට කටයුතු නොකළ පාර්ශව වෙත පියවර ගැනීමත්, විධිමත් පරිදි කටයුතු කර අදාළ මුදල අය කර ගැනීමටත් කටයුතු කළ යුතුය.
(ජ)	බියගම ගොවිජන සේවා කාරක සභාවේ 2024 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු රු.384,614 ක් වූ ලැබිය යුතු ශේෂ වලින් රු.103,108 ක් අවුරුදු 10 ඉක්මවූ ණය ශේෂයක් වන අතර රු.281,506 ක් වූ ණය ශේෂ 02 ක් අවුරුදු 05-10 ත් අතර වුවද මෙම ණය ශේෂ අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.	පිළිතුරු ලබා දී නොතිබුණි.	කාලීනව ණය ශේෂ අය කිරීමට කටයුතු නොකළ පාර්ශව වෙත පියවර ගැනීමටත්, එම ණය ශේෂ කඩිනමින් අය කර ගැනීමටත් කටයුතු කළ යුතුය.
(ට)	ගොවිජන සේවා කාරක සභාවල සවිකර ඇති ඇඟිලි සලකුණු යන්ත්‍ර නිරන්තරයෙන් අක්‍රීය තත්වයට පත් වී තිබුණු අතර කාරක සභා 07 කට අදාළව යන්ත්‍රයේ ඇඟිලි සටහන් සලකුණු කරන නමුත් එහි පවතින මෘදුකාංග දෝෂයක් හේතුවෙන් වාර්තා ලබාගත නොහැකි තත්වයක් පැවතීම මත ඇඟිලි සලකුණු යන්ත්‍ර සවිකිරීමේ අරමුණු ඉටු වී නොතිබුණි.	පිළිගනිමි. ඇඟිලි සළකුණු යන්ත්‍රයේ පවතින අඩුපාඩු පිළිබඳව අදාළ සමාගම හා දිස්ත්‍රික් කාර්යාලය දැනුවත් කර ඇත.	විධිමත් අධීක්ෂණයක් යටතේ ඇඟිලි සළකුණු යන්ත්‍ර ක්‍රියාකාරීව පවත්වා ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය.

3.2 අරමුදල් ඌන උපයෝජනය

	විගණන නිරීක්ෂණ	කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	කාරක සභා 02 කට අදාළව 2021 වර්ෂයේදී කාබනික පොහොර නිෂ්පාදන ව්‍යාපෘති සඳහා ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවෙන් ලබා දී තිබුණු එකතුව රු.200,000 ක් වූ ප්‍රතිපාදනවලින් රු.138,675ක මුදලක් අදාල කාර්යයට යොදාගෙන නොතිබුණි.	එකඟ වෙමි. උපදෙස් ලැබීමෙන් අනතුරුව මුදල් ආපසු යැවීමට කටයුතු කරමි.	අදාළ කොම්පෝස්ට් නිෂ්පාදන කටයුතු සඳහා යොදාගැනීමට හෝ ගොවිජන සංවර්ධන කොමසාරිස් වෙත නිරවුල් කිරීමට

			පියවර ගත යුතුය.
(ආ)	සහනාධාර පොහොර වැඩසටහනකට අදාළව පල්ලෙවෙල ගොවිජන සේවා කාරක සභාව විසින් ආරම්භ කර තිබුණු බැංකු ජංගම ගිණුම 2021 වර්ෂයේ සිට ගණුදෙනු සිදු නොකර අක්‍රිය තත්ත්වයේ පැවති අතර 2024 දෙසැම්බර් 31 දිනට එම ගිණුමේ ශේෂය රු.97,525 ක් විය.	සහනාධාර පොහොර ක්‍රියාත්මක නොවන බැවින් කම්ටු ගිණුමට මාරු කිරීමට කිරීමට කටයුතු කරමි.	මෙම මුදල් ඵලදායි ලෙස කළමනාකරණය කිරීමට කටයුතු කළ යුතුය.

3.3 **වත්කම් කළමනාකරණය**

	විගණන නිරීක්ෂණ	කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ගොවිජන සේවා කාරක සභා 7 කට අදාළව ගොවිජන බැංකු සඳහා 2023 හා 2024 වර්ෂවල මිලදී ගෙන තිබූ රු.1,604,960 ක් වටිනා ස්කෑනර්, මුද්‍රණ යන්ත්‍ර ඇතුළු පරිගණක හා උපාංග සමාලෝචිත වර්ෂයේදී ද භාවිතයට ගෙන නොතිබුණි.	ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවෙන් මෘදුකාංගය හා පද්ධතිය මෙතෙක් ලබා දී නොමැති බව දන්වමි.	අදාළ මෘදුකාංගය හා පද්ධතිය කඩිනමින් ලබා ගෙන මෙම පරිගණක හා උපාංග ඵලදායීව යොදාගැනීමට පියවර ගත යුතුය.
(ආ)	2003 වර්ෂයේ දී මීරිගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මගින් තාවකාලිකව පස්යාල ගොවිජන සේවා කාරක සභාව වෙත ලබා දී තිබුණු රෝද හතරේ ට්‍රැක්ටරය 2025 මැයි මාසය වන විට ක්‍රියාකරවීමට නොහැකිව ට්‍රැක්ටරය, ටේලරය සහ නගුල් මධ්‍යස්ථානය පිටුපස මඩුවක දිරාපත්වෙමින් පැවති අතර එය අළුත්වැඩියා කර නැවත ප්‍රයෝජනයට ගත හැකි තත්වයට පත්කර ගැනීමට කාරක සභාව විසින් කටයුතු කර නොතිබුණි.	නැවත අළුත්වැඩියාව සඳහා විශාල මුදලක් දැරීමට සිදු වන අතර ඒ සඳහා කාරක සභාව සතුව මුදල් නොමැති බව දන්වමි.	ට්‍රැක්ටරය අළුත්වැඩියා කර සභාවේ භාවිතයට ගැනීම හෝ අළුත්වැඩියා කර භාවිතයට ගත හැකි වෙනත් සභාවකට පැවරීම හෝ විධිමත් අනුමැතිය යටතේ අපහරණය කිරීමට හෝ කටයුතු කළ යුතුය.
(ඇ)	පල්ලෙවෙල ගොවිජන සේවා කාරක සභාවේ ඉන්වෙන්ට්‍රි ලේඛනයේ දක්වා ඇති ඡායාපිටපත් යන්ත්‍රයක්, තණකොළ කපන යන්ත්‍ර 03ක් සහ විල් බැරෝ 01ක් ප්‍රයෝජනයට ගැනීමෙන් තොරව ගබඩා කර තිබුණු අතර අලුත්වැඩියා කිරීමට හෝ අපහරණය කිරීමට කාරක සභාව කටයුතු කර නොතිබුණි.	වත්කම් අලුත්වැඩියා කර ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කරමි.	කඩිනම් පියවර ගෙන අළුත්වැඩියාවන් සිදු කර වත්කම් ඵලදායී ලෙස භාවිතයට ගැනීමට කටයුතු කළ යුතුය.

(ඇ)	මීරිගම ගොවිජන සේවා කාරක සභාව සතු රෝද 4 ට්‍රැක්ටරය වසර ගණනාවක සිට ක්‍රියාකාරී තත්ත්වයේ නොවූ අතර කිසිදු කාර්යකට භාවිතා නොකර කාර්යාල පරිශ්‍රයේ ගාල්කර තිබුණි.	ගොවිජන සංවර්ධන සහකාර කොමසාරිස්ගේ උපදෙස් මත ඉදිරි කටයුතු කරමි.	කඩිනම් පියවර ගෙන අළුවැඩියාවක් සිදු කර වත්කම් ඵලදායී ලෙස භාවිතයට ගැනීමට කටයුතු කළ යුතුය.

3.4 **ව්‍යාපෘති ප්‍රමාදයන්**

	විගණන නිරීක්ෂණය	කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ගොවිජන සේවා කාරක සභා 03 කට අදාළව ප්‍රමුඛතාව හඳුනාගෙන තිබුණු රු.1,966,111 ක් වූ ව්‍යාපෘති 04 ක් ක්‍රියාත්මක කර නොතිබුණි.	වර්ෂාව හේතුවෙන් ක්‍රියාත්මක කළ නොහැකි විය.	අදාළ ව්‍යාපෘති කඩිනමින් ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතුය.

3.5 **මානව සම්පත් කළමනාකරණය**

	විගණන නිරීක්ෂණය	කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	කාරක සභා 26 කට අදාලව පැවති කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන වසම් 741 ක් සඳහා අනුයුක්ත කළ නිලධාරීන් සංඛ්‍යාව 475 ක් වූයෙන් වසම් 266 ක වැඩ බලන තත්ත්වයක් ඇති වී තිබුණි.	පුරප්පාඩු වන වසම් සඳහා නව නිලධාරින් බඳවා නොගැනීම හේතුවෙන් එම වසම් සඳහා වැඩ බලන නිලධාරීන් පත්කර තිබීම.	විධිමත් වැඩපිළිවෙලක් යටතේ වසම්වල ගොවි ජනතාව වෙත සේවය කාර්යක්ෂමව ලබා දීමට කටයුතු කළ යුතුය.

3.6 **ලැබිය යුතු හා ගෙවිය යුතු ශේෂ**

(අ)	ගලහිටියාව ගොවිජන සේවා කාරක සභාවේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ දැක්වෙන වසර 04 සිට 14 දක්වා කාලපරිච්ඡේදයකට අදාල රු.291,164 ක් වූ ගෙවිය යුතු ගිණුම් ශේෂ 08 ක් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.	පිළිතුරු ලබා දී නොතිබුණි.	ගෙවිය යුතු ශේෂ නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය.

	විගණන නිරීක්ෂණය	කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(ආ)	ගලහිටියාව ගොවිජන සේවා කාරක සභාවේ වසර ගණනාවක සිට පැවතෙන රු.183,461 ක ලැබිය යුතු ශේෂ 12 ක් හා හිටපු අලෙවි ලිපිකරුවෙකුගෙන් වසර 4 කට වඩා වැඩි කාලයක සිට අයකරගත නොහැකිව තිබූ රු.21,675 ක මුදලක් සහ හිටපු ගොවිජන සංවර්ධන නිලධාරිවරයෙකුගෙන් වසර 15 කට වඩා වැඩි කාලයක සිට අයකරගත නොහැකිව තිබූ රු.528,722 ක මුදලක් සමාලෝචිත වර්ෂය අවසානයටත් අයකරගෙන නොතිබුණි.	පිළිතුරු ලබා දී නොතිබුණි.	ණය ශේෂ අය කර ගැනීමට කටයුතු කළ යුතු අතර, ඒවා කාලීනව අය කිරීමට කටයුතු නොකළ පාර්ශව වෙත පියවර ගත යුතුය.

4. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

4.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

	විගණන නිරීක්ෂණය	**කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම**	**නිර්දේශය**
(අ)	2018 අංක 19 දරන ජාතික විගණන පනතේ III කොටස 16(2) වගන්තිය සහ 2021 නොවැම්බර් 16 දිනැති අංක පී.ඊ.ඩී. 01/2021 දරන චක්‍රලේඛය සමග වූ "මෙහෙයුම් අත්පොතේ" 6.6 ඡේදය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන විගණනය සඳහා ගිණුම් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුලත විගණකාධිපති වෙත ඉදිරිපත් කලයුතු වුවත් ගලහිටියාව ගොවිජන සේවා කාරක සභාවේ 2024 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2025 ජූනි 03 දින විගණනය සඳහා ඉදිරිපත් කර තිබුණි.	පිළිතුරු ලබා දී නොතිබුණි.	2018 අංක 19 දරන ජාතික විගණන පනත හා චක්‍රලේඛයට අනුව නියමිත දිනට මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කළ යුතුය.

5. ගොවිජන බැංකු

	විගණන නිරීක්ෂණය	**කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම**	**නිර්දේශය**
(අ)	ගොවිජන සේවා කාරක සභා 23 කට අයත් ගොවිජන බැංකු 23කට අදාලව කල් ඉකුත් වූ ණය අය කර ගැනීම සඳහා විනිශ්චය සභා වෙත යොමු කිරීම, අධිකරණ ක්‍රියාමාර්ග ගැනීම සිදු කර තිබුණද 2024 දෙසැම්බර් 31 දිනට බැංකු විසින් ලබාදුන් ණය වලින් ණය ලාභීන් 1077 කට අයත් කල් ඉකුත් වූ එකතුව රු.27,592,687 ක් වූ ණය මුදලක් අය කර ගෙන නොතිබුණි .	හිඟ ණය අය කර ගැනීම සඳහා විනිශ්චය සභා වෙත යොමු කිරීම, අධිකරණ ක්‍රියාමාර්ග ගැනීම සිදු කර ඇත.	හිඟ ණය ශේෂයන්ට අදාළ ණය ලබා දීම හා කාලීනව අය නොකිරීම පිළිබඳ විධිමත් පරීක්ෂාවක් සිදු කිරීමත්, හිඟ ණය ශේෂයන් කඩිනමින් අය කර ගැනීමත් කළ යුතුය.
(ආ)	ගොවිජන සංවර්ධන කොමසාරිස්ගේ 2022 අප්‍රේල් 27 දිනැති අංක 7/12/5/4 දරන චක්‍රලේඛ ලිපියේ 04 ඡේදය ප්‍රකාරව ලියාපදිංචි ගොවි සංවිධානවල පවතින අරමුදල්වලින් කොටසක් ගොවිජන බැංකුවෙහි තැන්පත් කලයුතු වුවත්	ගොවි සංවිධාන වෙත අරමුදල් තැන්පත් කරන ලෙස දැනුවත් කර ඇත.	විධිමත් අධීක්ෂණයක් හා මග පෙන්වීමක් සිදු කර චක්‍රලේඛ ප්‍රකාරව තැන්පත් පවත්වා ගැනීමට කටයුතු කළ

	කාරක සභා 14 කට අදාළව මුළු ගොවි සංවිධාන 549 කින් 372 ක් පමණක් ගොවිජන බැංකුවෙහි තැන්පත් පවත්වාගෙන ගොස් තිබුණි.		යුතුය.
(ඈ)	2024 දෙසැම්බර් 31 දිනට ගොවිජන බැංකු 12 කට අයත් තැන්පත් ගිණුම් 29216 කින් ගිණුම් 15429 ක් අක්‍රියව පැවතුණි.	ගිණුම් හිමියන් දැනුවත් කර ගිණුම් සක්‍රීය කරන මෙන් දැනුවත් කර ඇත.	විධිමත් අධීක්ෂණයක් මඟ පෙන්වීමක් යටතේ අක්‍රීය ගිණුම් සක්‍රීය කිරීමට කටයුතු කළ යුතුය.